**ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

**---------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තොබර් 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම පිළිබඳ ප්‍රකාශනයේ කොමිෂන් සභාවේ පොත් අනුව ශේෂය රු.2,450 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.32,450 ක් වූයෙන් රු.30,000 ක වෙනසක් පැවතුණි. | අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු. 30,000.00 ක් අතපසුවීමකින් වාර්තා නොවී ඇති බව. | වර්ෂය අවසානයේ කොමිෂන් සභාවේ තැන්පතු ගිණුම පිළිබඳ ප්‍රකාශයේ ශේෂය භාණ්ඩාගාර පොත් අනුව ශේෂය සමඟ සැසඳිය යුතු වීම. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.49,523 ක් වූ ගෘහ භාණ්ඩ වටිනාකම වැරදීමකින් සන්නිවේදන උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී සිදු වූ දෝෂයක් හේතුවෙන් සන්නිවේදන උපකරණ යටතේ දක්වා ඇත. | නිවැරදි වර්ගීකරණයන් යටතේ වත්කම් ගිණුම් ගත කළ යුතුවීම. |
| (ii) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රු.45,156,061 ක් වූ ස්ථාවර වත්කම් ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.45,018,493 ක් වූයෙන් රු.137,568 ක වෙනසක් පැවතුණි. | සැප්තැම්බර් සිට දෙසැම්බර් 31 දක්වා මිල දී ගත් ස්ථාවර වත්කම් වල වටිනාකම වැය ශීර්ෂය 335 හි යාවත්කාලීන වී නොතිබුණි. එම අගයන් යාවත්කාලීන කරන ලද්දේ 2021 ජනවාරි මස දී වන අතර ඒ වන විට එම අගය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හි වාර්තා වී නොතිබුණි. | කොමිෂන් සභාවේ ස්ථාවර වත්කම් ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ශේෂය සමඟ ගැළපිය යුතුවීම. |

(ඇ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැදීම් හා බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2021 වර්ෂයේ සිට බැදීම් හා බැරකම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| **(ii)** | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව පොදු තැන්පතු ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට පොදු තැන්පතු ලේඛණය නිසි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

(ඇ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 (6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2021 ජූලි 31 දින වන විටත් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු අඛණ්ඩව නොපැවතීම හේතුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව සිදු කළ යුතු වූ භාණ්ඩ අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි විය. ඒ හේතුවෙන් අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු නමුත් කොමිෂන් සභාව සතුව පවතින වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | කොමිෂන් සභාවේ වාහනවල ඉන්ධන දහනයේ අසාමාන්‍ය වෙනසක් නොපැවතීම හේතුවෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදු නොකරන ලද අතර ඉදිරියේ දී එම පරීක්ෂාවන් කාලානුරූපීව සිදු කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදු කල යුතුවීම. |
| (iii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 වියදම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වෙන්කළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය නොකරන ලද වැය විෂයයන් 7 කට අදාළ ඉතිරිවීම් වටිනාකම රු.1,491,775 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු අඛණ්ඩව නොපැවතීම හේතුවෙන් අවුරුද්ද සඳහාම වෙන් වී තිබූ වාර්ෂික පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරි වූ බව. | කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ ළගා කර ගත හැකි අයුරින් ප්‍රතිපාදන උපයෝජනය කලයුතු වීම. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.161,110 ක් වූ බැරකම් අයිතම 02 ක් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් බැරකම් ප්‍රමාද දෝෂයක් මත බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කිරීමට නොහැකි වී ඇති බව. | වර්ෂයට අදාළ සියලුම බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතුවීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් 1992 වර්ෂයේ ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා වූ යෝජනාවලිය පදනම් කරගෙන 1997 වර්ෂයේ ජනාධිපතිවරයා විසින් අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත්කර තිබුණ ද ඉන් පසුව ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා යෝජනාවලින් ප්‍රතිපත්ති ලෙස ප්‍රකාශයට පත්කර නොතිබුණි. | මෙම කොමිෂන් සභාවේ කාර්යය වනුයේ ප්‍රතිපත්ති යෝජනා සකස් කර ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම පමණක් වන අතර එය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් බව. | කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවලින් පදනම් කර ගෙන අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා යෝජනාවලින් ප්‍රතිපත්ති ලෙස ප්‍රකාශයට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කෙරෙමින් පවතින බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුවීම. |

## 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ හා සංවර්ධන වැය විෂය යටතේ 2020 වර්ෂයට අදාළව පර්යේෂණ යෝජනා 05 ක් වෙනුවෙන් සමාලෝචන කමිටු අනුමැතිය 2021 පෙබරවාරි 10 දින ලබා දී තිබුණ ද එම අනුමැතියට පෙර එනම් 2020 දෙසැම්බර් 14 දින රු.120,000 බැගින් රු.600,000 ක් නිපුණතා සහිත විශේෂඥයින් වෙනුවෙන් ගෙවා තිබුණි. එසේම නිපුණතා සහිත විශේෂඥයින් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. | පර්යේෂණ යෝජනා සඳහා සමාලෝචන කමිටු රැස්වීම පැවැත්වීමට දිනයක් යොදා ගැනීමට නොහැකි වීම මත එම කමිටුවේ නිර්දේශයන්ට අනුකූල වන අයුරින් සංශෝධන සිදු කිරීමට එකගවන පදනම යටතේ ගෙවීම් සිදු කිරීමට සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කලයුතු අතර විධිමත් අනුමැතිය මත ගෙවීම් කිරීමට කටයුතු කල යුතුවීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී, ආයතනයට අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනා ගෙන තිබුණ ද එම ඉලක්ක ලඟා කර ගත යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ලඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ලඟා කර ගැනීම මැන බැලීම සඳහා වන නිර්ණායක අදාල වන්නේ මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් වන හෙයින් මෙම ආයතනය ඒ සම්බන්ධයෙන් දර්ශක හඳුනාගැනීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි. ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන් හිදී මෙම අරමුණු පිළිබඳව අවධානය යොමු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි. | ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන්හි දී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව සියලුම ආස්ථිතායන්හි අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා එම ආස්ථිතායේ පාලක මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකයෙකු පත් කළ යුතු වුවද කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර අභ්‍යන්තර විගණක ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. එසේම රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා විගණන කටයුතු කිරීමට ඉල්ලීම් කර තිබුණ ද වාර්තාවේ දිනය දක්වාම එම කටයුතු ක්‍රියාත්මක වී නොතිබුණි. | කොමිෂන් සභාව සඳහා වෙනමම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කිරීම වෙනුවට අදාල කාර්යය රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා විගණනයක් සිදු කරවා ගැනීමට ඉල්ලීමක් සිදු කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 34 ක් වූයෙන් තවදුරටත් පුරප්පාඩු 11 ක් පැවතුණි. | තනතුරු සඳහා ඉදිරියේ දී බඳවා ගැනීම් සිදු කිරීමට සැලසුම් කරමින් පවතින බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතුවීම. |